# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
සුහුරුපාය, බත්තරමුල්ල

තැ.පෙ.අංකය
த. பெ.இ 2171635
Po.Box No — 10120

ෆැක්ස්
தொலைநகல
Fax — 011-

දුරකථන
தொலைபேசி
Telephone — 011-2887973 (HUNTING)

වෙබ්.ලිපිනය
இணையதளம்
Web Site — www.Police.lk

ඊ මේල්
மின்னஞ்சல்
E-mail — dir.media@police.gov.lk


මගේ අංකය
எனது இலக்கம்
My NO — 1577/2024

ඔබේ අංකය
உமது இலக்கம்
Your No — / 2024

දිනය
திக
Date — 13/10/2024
පැය 1405

## මාධ්‍ය නිවේදනය

### 01. මනුෂ්‍ය ඝාතනයක් - මාදම්පේ පොලිස් වසම.

2024.10.13 වන අද දින උදෑසන කාලයේ මාදම්පේ පොලිස් වසමේ සුදුවැල්ල ප්‍රදේශයේ නිවසක් තුල පුද්ගලයෙකු ඝාතනය කර ඇති බවට මාදම්පේ පොලිස් ස්ථානයට ලද තොරතුරක් මත විමර්ශන ආරම්භ කර ඇත.

**මරණකරු වයස අවුරුදු 35 ක් වූ සුදුවැල්ල, මාදම්පේ ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මරණකරු නිවසේ කාමරයක් තුල බිම නිදාගෙන සිටියදී තියුණු ආයුධයකින් පහරදී මෙම ඝාතනය සිදු කර ඇති බවට දැනට සිදු කරන ලද විමර්ශනයේ දී අනාවරණය වී ඇත. සැකකරුවන් අත්අඩංගුවට ගැනීම සඳහා මාදම්පේ පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

### 02. දියේ ගිලී මිය යාමක් - මුල්ලේරියාව පොලිස් වසම.

2027.10.12 වන දින රාත්‍රී කාලයේ මුල්ලේරියාව පොලිස් වසමේ කැළණිමුල්ල ප්‍රදේශයේ දෙපාඇලේ ඔරුවක් පෙරලීමෙන් පුද්ගලයෙකු දියේ ගිලී මිය ගොස් ඇති බවට මුල්ලේරියාව පොලිස් ස්ථානයට ලද තොරතුරක් මත විමර්ශන ආරම්භ කර ඇත.

**මරණකරු වයස අවුරුදු 34 ක් වූ ගංසභාපාර, කැළණිමුල්ල ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මෙම පුද්ගලයා තවත් පිරිසක් සමඟ ගංවතුරෙන් යට වී ඇති ප්‍රදේශ නැරඹීමට ඔරුවකින් ගමන් කරමින් සිටියදී ඔරුව පෙරලීමෙන් මෙම අනතුර සිදුව ඇති බවට විමර්ශනයේදී අනාවරණය වී ඇති අතර මුල්ලේරියාව පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**03. අයිස් මත්ද්‍රව්‍ය සහ හෙරොයින් සමඟ සැකකරුවන් දෙදෙනෙකු අත්අඩංගුවට - ගල්කිස්ස පොලිස් වසම.**

2024.10.13 වන අද දින අළුයම් කාලයේදී ගල්කිස්ස පොලිස් වසමේ බඩෝවිට ප්‍රදේශයේදී ගල්කිස්ස පොලිස් ස්ථානයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරු මත වැටලීමක් සිදුකර **අයිස් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 10 මිලිග්‍රෑම් 800 ක්** හා **හෙරොයින් ග්‍රෑම් 06 මිලිග්‍රෑම් 300 ක් සන්තකයේ තබාගෙන සිටි සැකකරුවන්** දෙදෙනෙකු අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරුවන් අවුරුදු 28, 32 වයස් වල පසුවන මොරටුව හා ගල්කිස්ස ප්‍රදේශවල පදිංචිකරුවන් වේ.**

ගල්කිස්ස පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**